# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2295/20 - 2022 සැප්තැම්බර් මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2022.09.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2018/52-(Sub).

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.03.25 දිනැති හා අංක 2220/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2021.03.18 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් 1. වැලිමඩ, දඹවින්න, අගන උල්පත, හි පදිංචි පී. ඒ. එම්. රත්නපාල මයා, 2. බදුල්ල, වැල්ගොල්ල, පරගහමුල්ල පදිංචි එච්. එම්. නිමල් ශාන්ත මයා, 3. වැලිමඩ, දඹවින්න, වැරැල්ල පතන පදිංචි ආර්. ඩී. මහින්ද රාජපක්ෂ මයා, 4. බණ්ඩාරවෙල, කිණිගම, මැදහින්න, අංක 111 හි පදිංචි ලසිත සෙනරත් විජේසුන්දර මයා, 5. මහියංගණය, හෙවන්වත්ත, කුඹුක්ගොල්ල, හංසිකා සෙවන පදිංචි එච්. එම්. චන්දන කුමාර මයා, 6. දෙහිඅත්තකණ්ඩිය, බඹරවාන, අංක 334/1 හි පදිංචි ඩබ්. ජී. ක්‍රිෂාන් විල්පොල මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.06.07 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අගෝස්තු මස 17 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව.
කොළඹ 05.

1A - G 37365 — 13 (2022/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය : IR/COM/02/2018/52-(Sub).

**කොළඹ කාර්මික අධිකරණයේ දී ය**

පැමිණිලි පාර්ශවය (ඉල්ලුම්කරුවන්)

A/33/2021

01. පී. ඒ. එම්. රත්නපාල මයා, අගන උල්පත, දඹවින්න, වැලිමඩ.
02. එච්. එම්. නිමල් ශාන්ත මයා, පරගහමුල්ල, වැල්ගොල්ල, බදුල්ල.
03. ආර්. ඩී. මහින්ද රාජපක්ෂ මයා, වැරැල්ල පතන, දඹවින්න, වැලිමඩ.
04. ලසිත සෙනරත් විජේසුන්දර මයා, 111, මැදහින්න, කිණිගම, බණ්ඩාරවෙල.
05. එච්. එම්. චන්දන කුමාර මයා, හංසිකා සෙවන, කුඹුක්ගොල්ල, හෙවන්වත්ත, මහියංගනය.
06. ඩබ්. ජී. ක්‍රිෂාන් විල්පොල මයා, 334/1, බඹරවාන, දෙහිඅත්තකණ්ඩිය.

එදිරිව

වග උත්තරකාර පාර්ශවය
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
200, කිරුළ පාර,
කොළඹ 05.

බේරුම්කරණ ප්‍රදානය

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 [1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා] දරන පනත්වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව ඉහත දෙපාර්ශවය අතර පැන නැගී ඇති ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මත්තේගොඩ, කුඩමාදුව, "ද විලේජ්" හි 202/B/61 පදිංචි නීතිඥ විජේසූරිය ආරච්චිලාගේ ජයවික්‍රම වන මා, 2021 මාර්තු 18 දින පත්කරනු ලැබීය.

ඒ අනුව කම්කරු කොමසාරිස් ජනරාල් බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතාගේ අංක IR/COM/02/2018/52(Sub) හා 2021 මාර්තු 16 දින ලේඛනය මගින් ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අනියම් හා කොන්ත්‍රාත් සේවකයින් ලෙස දීර්ඝ කාලයක් සේවය කරන පී. ඒ. එම්. රත්නපාල, එච්. එම්. නිමල් ශාන්ත, ආර්. ඩී. මහින්ද රාජපක්ෂ, ලසිත සෙනරත් විජේසුන්දර, එච්. එම්. චන්දන කුමාර, ඩබ්. ජී. ක්‍රිෂාන් විල්පොල යන සේවකයින්ගේ සේවය ස්ථිර නොකිරීමෙන් අසාධාරණයක් සිදුවී ඇත් ද? යන්න හා, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමි විය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳව වේ."

රට තුළ පැවති කොරෝනා වසංගතය හේතුවෙන් සැලසුම් කළ පරිදි මෙම බේරුම්කරණය ආරම්භ කිරීමට නොහැකි වූ නමුත් විවිධ දුෂ්කරතා මධ්‍යයේ ප්‍රථම සැසිය 2021.12.09 දින කොළඹ දී පවත්වන්නට විය. ඒ සඳහා I පාර්ශවයේ ඉල්ලුම්කරුවන් අතුරින් එච්. එම්. නිමල් ශාන්ත මයා හැරුණු විට සියලු දෙනාද, ඔවුන් වෙනුවෙන් වෘත්තීය සමිති නියෝජිතයින් පෙනී සිටි අතර, ආරම්භක අවස්ථාවේදීම වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි නීතිනිලධාරි ප්‍රකාශ කරනු ලැබුවේ මෙම නඩුවේ සමථයක් සඳහා යෝජනා කරන බවයි, ඒ. අනුව පැමිණිලිකාර පාර්ශවයේ සියලු දෙනා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඉහළ කළමනාකාරීත්වයේ අනුමැතිය මත ස්ථිර සේවයට ඇතුළත් කිරීමට හැකි බවත්, හිඟ වැටුප් ලබා දීමකින් තොරව ඔවුන් සේවයේ ස්ථිර කරන බවත්, එක් එක් පැමිණිලිකරුගේ පෞද්ගලික ලිපි ගොනු අනුව ප්‍රාදේශීය කාර්යාලවලින් ලබා ගත යුතු වාර්ථා ලබා ගැනීමෙන් අනතුරුව ස්ථිර සේවයට ඇතුළත් කරන බවත් පැවසීය. එකී සමථයට එකඟ බවත්, සේවා කොන්දේසි හෝ සමථ කොන්දේසි ඉදිරිපත් කිරීමට යටත්ව පැමිණිලි පාර්ශවය ඊට එකඟ විය.

මෙම බේරුම්කරණ විභාගයේ දෙවන දිනයේ සිට එනම් 2022.01.31 දින සිට අවසානය දක්වා වගඋත්තරකරුවන් වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ නීතිඥවරියක් අඛණ්ඩව පෙනී සිටින ලදී. ඒ අනුව 2022.01.31, 2022.03.30, 2022.04.27, 2022.06.01 හා 2022.06.07 යන දිනවලදී දෙපාර්ශවය යෝජිත සමථ කොන්දේසි හා අනෙකුත් කරුණු පිළිබඳ දීර්ඝ සාකච්ඡාවක් පවත්වන්නට යෙදුණි. පැමිණිලිකරුවන්ගේ සේවය ස්ථිර කිරීමේදී රජය අලුතින් හඳුන්වා දී ඇති N. V. Q. සුදුසුකම් (ජාතික වෘත්තීය සුදුසුකම්) නොමැතිව ස්ථිර කිරීමේ දුෂ්කරතාවය වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කළ අතර, බේරුම්කරු වශයෙන් මා ඊට මැදිහත්වී මෙම පැමිණිලිකරුවන් නවක සේවකයන් නොවන බවත්, ඔවුන් අවු. 10 වඩා වැඩි කාලයක් කොන්ත්‍රාත්, අනියම් සේවකයන් වශයෙන් සේවය කර ඇති බවත් ඔවුන් බඳවාගෙන ඇත්තේ ජාතික වෘත්තීය සුදුසුකම් (N. V. Q.) මට්ටම් හඳුන්වා දීමට පෙර බැවින් ඒ පිළිබඳ සලකා පැමිණිලිකරුවන් සම්බන්ධ වෙනත් නෛතික හෝ විනය කටයුතු නොවේ නම් ස්ථිර කළ හැකි බව පෙන්වා දුනිමි.

මෙම නඩුවේ අවසන් දින 03 ට වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් සහභාගී වූ නියෝජ්‍ය මානව සම්පත් කළමනාකරු ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඉහළ කළමනාකාරීත්වය හා අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ එකඟතාවයට පත්වීමෙන් අනතුරුව පහත සැලැස්ම පරිදි පැමිණිලිකරුවන්ගේ සේවය ස්ථිර කිරීමට යෝජනා කරන ලදී.

**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2022.06.07 දින ඉදිරිපත් කළ සේවය ස්ථිර කිරීමේ සැලැස්ම**

**(අංක 01)**

| අ/අ | නම | තනතුර | සේවය ස්ථිර කළ හැකි දිනය | වැටුප් පාදය |
|---|---|---|---|---|
| 1 | ලසිත සෙනරත් විජේසුන්දර | මෝටර් කාර්මික<br>ප්‍රාථමික ශිල්පීය සේවා ශ්‍රේණිය - PL III | 2022.06.01 | 26,290/= |
| 2 | පී. ඒ. එම්. රත්නපාල | වඩුකරු<br>ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ශ්‍රේණිය - PL II | 2022.06.01 | 25,750/= |
| 3 | ආර්. ඩී. මහින්ද රාජපක්ෂ | තහඩුකරු<br>ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ශ්‍රේණිය - PL II | 2022.06.01 | 25,750/= |
| 4 | ඩබ්. ජී. ක්‍රිෂාන් විල්පොල | කම්කරු<br>ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ශ්‍රේණිය - PL I | 2022.06.01 | 24,750/= |
| 5 | එච්. එම්. චන්දන කුමාර | කාර්යාල කම්කරු<br>ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ශ්‍රේණිය - PL I | 2022.03.01 | 24,470/= |

- ❖ මෙම අය රාජකාරියට වාර්තා කර ඇත.

ඉහත ස්ථිර කිරීමේ ලේඛනය මෙම බේරුම්කරණ නඩුව ආරම්භයේ සිට අවසානය දක්වා කිසිම දිනක සහභාගී නොවූ එච්. එම්. නිමල් ශාන්ත මයාගේ නම ඇතුළත්ව තිබුණ ද එය ඉවත් කරන්නට දෙපාර්ශවයේ එකඟතාවය මත තීරණය කළෙමි.

පැමිණිලිකාර පාර්ශවය වෙනුවෙන් ඉදිරිපත් වූ වෘත්තීය සමිති නියෝජිතයන් ප්‍රකාශ කරනු ලැබුවේ පැමිණිලිකරුවන් දීර්ඝ කාලයක් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට සේවය කර ඇති බැවින් ඔවුන්ගේ ස්ථිර කිරීම පෙරදාතම් කළ යුතු බවයි. නමුත් මෙම බේරුම්කරණයට අදාළ ගැටලුවට පත්වීම් පෙරදාතම් කිරීම ඇතුළත් නොවන බවත්, පෙරදාතම් කිරීම පරිපාලන කටයුත්තක් බැවින් ඊට අදාළ ඉල්ලීම පැමිණිලිකරුවන් විසින් වගඋත්තරකරුවන් වෙතින් කළ යුතු බව ද අනතුරුව වගඋත්තරකරුවන් ඒ පිළිබඳ පියවර ගතයුතු බව ද බේරුම්කරුගේ මතයයි. ඒ සම්බන්ධව අවශ්‍ය පියවරයන් ගැනීම මෙම බේරුම්කරණයේ විෂය පථයට අයත් නොවන බව තීරණය කරමි.

ඒ අනුව 2022.06.07 දින වගඋත්තරකරුවන් ඉදිරිපත් කළ ඉහත අංක 01 දරන සේවය ස්ථිර කිරීමේ සැලැස්මට දෙපාර්ශවයේ එකඟතාවය ඇති බැවින් හා ඒ අනුව පියවර ගැනීමට වගඋත්තරකරුවන් එකඟ වේ. මෙම බේරුම්කරණ නඩුවේ පාර්ශවකරුවන් එළඹී ඉහත තීරණය සාධාරණ හා යුක්තිසහගත තීරණයක් බවට නිගමනය කරමි.

2022 ජූනි මස 07 වැනි දින.

නීතිඥ ඩබ්. ඒ. ජයවික්‍රම,<br>
බේරුම්කරු.

EOG 09-0004